පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 488

ආයතනයේ නම : කොළඹ මහා නගර සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 488

நிறுவனத்தின் பெயர் - கொழும்பு மாநகர சபை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parlimentary Series No: 488

Name of the Institution : Colombo Municipal Council

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119(4)

රාජ්‍ය ගිණුම් කාරක සභාව - පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා 488

කොළඹ මහා නගර සභාව

	සාකච්ඡා කරන ලද ප්‍රධාන කරුණු	ප්‍රධාන ගණන් දීමේ නිලධාරි (ප්‍ර. ග. නි.)/ ගණන් දීමේ නිලධාරීගේ (ග.නි.) කරුණු පැහැදිලි කිරීම් කාරක සභාවේ නිරීක්ෂණ/ නීර්දේශ	වර්තමාන තත්ත්වය/ ප්‍රගතිය
01	මහා කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතියේ සැලැස්ම යාවත්කාලීන කිරීම.	1896 වර්ෂයේ දී සැලසුම් කර ඇති කොළඹ මළ නාලිකා පද්ධතියෙහි ඉදි කිරීම් 1906 වර්ෂයේ දී ආරම්භ කර ඇති බවත්, වර්තමානයේ ස්ථාපිත මළ නාලිකා පද්ධතියෙන් 90%ක් පමණ 1925 වර්ෂය වන විට අවසන් කර තිබූ බවත්, රජය විසින් 1972 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතියට සකස් කළ ප්‍රධාන සැලැස්ම (Master Plan) මත පදනම්ව වර්ෂ 1980 ගණන්වල දී මෙම පද්ධතියේ වැඩි දියුණු කිරීමක්	ග.නි.ගේ කරුණු පැහැදිලි කිරීමක් බැවින්, නිරීක්ෂණ /නීර්දේශ ගිණුම්කාරක සභාව මගින් ලබා දී නොමැත.

		සිදු කර ඇති බවත්, 1990 වර්ෂවලදී එම ප්‍රධාන සැලැස්ම යාවත්කාලීන කර ඇති බවත්, කොළඹ මහා නගර සභාවේ ග. නි. ප්‍රකාශ කළේය. රජය විසින් 1999-2000 වර්ෂ තුළදී කොළඹ මලාපවහන පද්ධතිය (Colombo Sewerage System) සඳහා තත්ත්ව තක්සේරුවක් (Condition Assessment) සිදු කර ඇති බව අනාවරණය වූ අතර එම තත්ත්ව තක්සේරුව මත පදනම්ව 2009 වර්ෂයේ දී රජය විසින් ආසියානු සංවර්ධන බැංකුව සමඟ සාකච්ඡා කළ බවද ඒ අනුව මහා කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතියට ඇමරිකානු ඩොලර් මිලියන (ඇ.ඩො.මි.) 110ක ණය මුදලක් ලබා දී ඇති බවද කාරක සභාව හමුවේ අනාවරණය විය. මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය Greater	

		Colombo Wastewater Management Project (GCWMP) සහ මහා කොළඹ ජලය සහ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය Greater Colombo Water & Wastewater Management Improvement Investment Project (GCWWMIIP) ලෙස ව්‍යාපෘති 02ක් ඇති බවත්, මහා කොළඹ අපජල කළමනාකරණ වයාපෘතිය තුළ ඇ.ඩො.මි. 80ක් සහ ඇ.ඩො.මි. 19.1 ලෙස ණය (Loans) 02ක් ඇති බවත්, ණය ගිවිසුම් 2009.09.28 දින අත්සන් කර ඇති අතර එය 2010.04.09 දින බලාත්මක (Effective) වී ඇති බවත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ග.නි. ප්‍රකාශ කළේය. ව්‍යාපෘතියේ සංකීර්ණත්වය හා ස්වභාවය අනුව 2023.06.30 දින	

		වනතුරු දීර්ඝ කිරීම් (Extension) 05ක් සමඟින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී ඇති බවද අනාවරණය විය.	
02	මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ පවතින සිවිල් කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු	* එම අනවසර පදිංචිකරුවන්ගේ නිවාස සඳහා කොළඹ මහා නගර සභාව විසින් වරිපනම් අංක නිකුත් කර තිබීම ගැටළු සහගත බව කාරක සභාව අවධාරණය කළේය. මහා නගර සභා ආඥා පනත අනුව ජලය බෑස යාම සහ අනවසර ඉදිකිරීම් සම්පූර්ණයෙන් ඉවත් කිරීමට කොළඹ මහා නගර සභාවට බලය ඇති හෙයින් මේ සම්බන්ධයෙන් මහා නගර සභා පනතට අනුව ක්‍රියාකළ යුතු බව විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය. මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කළ හැකි විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව ද සොයා බලන ලෙස කාරක සභාව විසින් ග.නි. වෙත උපදෙස් දෙන ලදී.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවට අයත් කාන්තා රැඳවියන්ගේ නේවාසික ගොඩනැගිල්ලෙහි මල අපවහන පද්ධතිය පිළිසකර කර අවසන් කර ඇත.

		කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව (DCC) මඟින්ද මේ සම්බන්ධයෙන් සක්‍රීය මැදිහත් වීමක් සිදුකළ හැකි බව සභාපතිවරයා පෙන්වා දුන්නේය. කොළඹ නගරයේ පොම්පාගාර (Pumping Stations) 8ක් අලුත්වැඩියා කිරීමට හා Force Mains 02ක් නැවත යෙදවීමටත් අදාළ ඇ.ඩො.මී. 57.12ක වටිනාකමකින් යුත් ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් කර නොමැති බව කාරක සභාව හමුවේ අනාවරණය විය. එම කොන්ත්‍රාත්තුව පිරිනමන ලද ඉන්දියානු සමාගම විසින් එහි කටයුතු අවසන් කර නොමැති බව මෙන්ම එම ව්‍යාපෘතියෙහි අකාර්යක්ෂමතාව පිළිබඳව ද කාරක සභාවේදී සාකච්ඡාවට ලක් විය.	පොම්පාගාර ව්‍යාපෘතිය යටතේ ආසියානු සංවර්ධන බැංකු (ADB) ණය මුදලින් අවසන් කිරීමට නොහැකිවූ පොම්පාගාර 4 මාළිගාවත්ත, බොරැල්ල, කිඹිරිගස්යාය සහ විටිස්වයික් සඳහා මධ්‍යම රජයේ අරමුදලින් ඇ.ඩො.මී. 20ක් ලබාදුනි. ඒ අනුව 2024-02-21 නව කොන්ත්‍රාත් සංශෝධනය අත්සන් කළ අතර 2025-12-31 දිනට අවසන් කිරීමට නියමිත විය. ඒ අනුව කොළඹ නගර සභාවේ කාර්යය මණ්ඩලය යොදාගෙන අධීක්ෂණ කටයුතු කරමින් 2025-12-31 පොම්පාගාර 4 අවසන් කර නගර සභාවේ ජලාපවහන අංශයට භාර දී ඇත. දැනට මාස 6ක (Operational Acceptance) ක්‍රියාත්මක කාලය සහ දින 540 ක දෝෂ සඳහා වගකීම් කාලයකට (Defect liability period) යටත්ව ක්‍රියාකාරීව පවතී.

		තලකොටුව ගාර්ඩින් ව්‍යාපෘතිය, කිරුළපන ප්‍රදේශයේ පොම්පාගාර 02ක් ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව හා සම්බන්ධ ව්‍යාපෘතියක් බවත්, වර්ෂ 03ක් සඳහා වූ එම කොන්ත්‍රාත්තුව 2017 වර්ෂයේදී කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කළ බවත් කොළඹ මහ නගර සභාවේ ග.නි. ප්‍රකාශ කළේය. ආසියානු සංවර්ධන බැංකුව (ADB) විසින් ව්‍යාපෘතියට දුන් ණය 2022 ඔක්තෝම්බර් මාසයේ අවසන් වූ පසු කොන්ත්‍රාත්තුව අවසන් වූ බව අනාවරණය වූ අතර, මේ වන විට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD) සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර එම ව්‍යාපෘතියට දේශීය අරමුදල් ලබා ගැනීමට කටයුතු කර නැවත ආරම්භ කිරීමට අපේක්ෂා කරන බවද අනාවරණය විය.	

		"Rehabilitation of Wastewater Pumping Stations" කොන්ත්‍රාත්තුවේ 70%ක පමණ වැඩ අවසන් කර ඇති බවත්, එම ව්‍යාපෘතිය තුළ පොම්පාගාර 8ක් ප්‍රතිසංස්කරණය කිරීමට සැලසුම් කර තිබූ බවත්, ඉන් පොම්පාගාර 4ක වැඩ අවසන් කර කොළඹ මහා නගර සභාවට බාර දී ඇති බවත්, එම කොන්ත්‍රාත්තුවට ඇතුළත් වූ කොම්පඤ්ඤවීදිය පොම්පාගාරය 2024 මැයි මාසය අවසන් වන විට කොළඹ වරාය නගර නල මාර්ගයට (port city) සම්බන්ධ කිරීමට බලාපොරොත්තු වන බවත් කොළඹ මහා නගර සභාවේ ග.නි. ප්‍රකාශ කළේය. එම කොන්ත්‍රාත්තුවට ඇතුළත් වැඩ අවසන් නොවූ ඉතිරි පොම්පාගාර 4 පිළිබඳව කාරක සභාව විමසන ලදී. එම පොම්පාගාරවල කටයුතු	

		කරගෙන යාමට රජයේ අරමුදල් වලින් ඇ.ඩො.මී. 20ක් ලබා දී ඇති බව අනාවරණය විය. එම කොන්ත්‍රාත්තුවට ඇතුළත් මාලිගාවත්ත පොම්පාගාරයේ කටයුතු සිදුවන බව ග.නි. ප්‍රකාශ කළේය. එම කොන්ත්‍රාත්තුවට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයට පසු නව සංශෝධනයක් (Contract Amendment) ඇතුළත් කොන්ත්‍රාත් ගිවිසුම 2024.02.21 දින අත්සන් කළ බවත් කොන්ත්‍රාත්තුවේ වැඩකටයුතු මධ්‍යම රජයේ ප්‍රතිපාදන වලින් 2025.12.31 දිනට අවසන් කිරීමට තීරණය ලබා දී ඇති බවද ග.නි. ප්‍රකාශ කළේය. එම පොම්පාගාර පුනරුජ්ඨාපන ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්මට (Action Plan) හා වැඩසටහනට (Work Programme) ඇතුලත් ඒ ඒ	

		කාර්යයන් අවසන් කිරීමට කාලවකවානු ඇතුළත් කරගන්නා ලෙසත්, ව්‍යාපෘතියේ ප්‍රගතිය පරීක්ෂා කිරීමට මාසිකව ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලෙසත් (progress review meeting) එම රැස්වීම්වල කාර්යය සටහන් පිටපත් විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත්, කාරක සභාව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණුන් දීමේ නිලධාරී ගණුන් දීමේ නිලධාරී (ග.නි.) වෙත කාරක සභාව නිර්දේශ කළේ ය.	
		එම කොන්ත්‍රාත්තුව පිළිබඳ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ	මාසික සමාලෝචන රැස්වීම රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් සෑම මාසයකම පවත්වනු ලබන අතර අවසන් වරට 2026. 05.26 දින පවත්වන ලදී.

<table>
<tr><td></td><td></td><td>ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් මාසික සමාලෝචන රැස්වීම් පවත්වන බව ප්‍ර.ග.නි. ප්‍රකාශ කළේය.</td><td colspan="4"></td></tr>
<tr><td>03</td><td>කොළඹ නගරයේ මාර්ගවල සවිකර ඇති දැන්වීම් පුවරු /LED Boards ප්‍රදර්ශනයෙන් ආදායම් ඉපයීම</td><td>දැන්වීම් පුවරු / LED Boards ප්‍රදර්ශනයෙන් කොළඹ මහා නගර සභාව විසින් උපයන ආදායම පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව කාරක සභාව අවධාරණය කළේය. දැන්වීම් පුවරු ප්‍රදර්ශනයෙන් රු. මිලියන 43 ක ආදායමක් උපයන බව ග.නි. කාරක සභාව හමුවේ ප්‍රකාශ කළේ ය.

<u>නිරීක්ෂණ/ නිර්දේශය</u>

කොළඹ නගරයේ මාර්ගවල සවිකර ඇති දැන්වීම් පුවරු ප්‍රදර්ශනය සඳහා අදාළ පෞද්ගලික සමාගම සමඟ ඇති කර ගත් ගිවිසුමේ පිටපතක්ද සමඟ එමඟින් ලබන ආදායම පිළිබඳ වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි /ග.නි වෙත නිර්දේශ කළේ ය.

කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/AQ/CPA/2024(I) හා 2024.07.12 දිනැති ලිපියෙන් ඉහත තොරතුරු ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.</td><td colspan="4"><table>
<tr><th>දැන්වීම් පුවරු වර්ගය</th><th>විස්තර</th><th>ලැබෙන වාර්ෂික ආදායම</th><th>ගිවිසුම</th></tr>
<tr><td>A. ගැන්ට්‍රි පුවරු සහ මාර්ග නාම පුවරු (Gantry sign & Street Name Boards)</td><td>මේ වන විට ගැන්ට්‍රි පුවරු 55 ක් සහ වීදි නාම පුවරු 1778 ක් කොළඹ නගරයේ ඉදි කර ඇත. මෙම ගැන්ට්‍රි පුවරු 55 අතුරෙන් LED දැන්වීම් පුවරු ක්‍රියාත්මක ගැන්ට්‍රි 8 ක් කොළඹ නගරය තුළ ඇත.</td><td>ගැන්ට්‍රි පුවරු සඳහා බිම් කුලිය රු. 21,664,400.00
LED දැන්වීම් පුවරු 8 සඳහා ප්‍රදර්ශන ගාස්තු: රු.4,400,000.00
වීථි නාම පුවරු 1778 ක් සඳහා ප්‍රදර්ශන ගාස්තු: රු.1,898,904.00
මුළු වාර්ෂික ආදායම: රු. 27,963,304.40</td><td>ගිවිසුම් අංක 3737 හා 121/2016 මේ සමඟ අමුණා ඇත (ඇමුණුම 1 සහ 2)</td></tr>
<tr><td>B. දැන්වීම් පුවරු ආදායම්</td><td>2023 සහ 2024 වර්ෂවල දැන්වීම් පුවරුවලින් ලැබූ ආදායම පිළිවෙලින් රු. 87,379,967.00 ක් සහ රු. 90,024,672.00ක් උපයන ලදී. තවද, අනවසර දැන්වීම් පුවරු</td><td>මෙමඟින් වාර්ෂිකව උපයන ලද ආදායම
2023 - රු. 87,379,967.00
2024 - රු. 90,024,672,00</td><td></td></tr>
</table></td></tr>
</table>

				ඉවත් කිරීමට කම්කරුවන් කණ්ඩායමක් ශ්‍රම මිලදී ගැනීමේ පදනමින් බඳවාගෙන ඒ මාර්ගයෙන් නිරන්තරයෙන් ක්ෂේත්‍ර පරීක්ෂා කරමින් අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීම සිදු කරනු ලබයි. මෙම දැන්වීම් පුවරුවලින් ලැබෙන ආදායම පෞද්ගලික ඉඩම් තුළ ඉදිකෙරෙන ප්‍රචාරක දැන්වීම් පුවරු මගින් ලැබෙන ආදායම් වේ. අංක 1713/10 හා 2011.07.05 දරණ දැන්වීම් පුවරු අතුරු ව්‍යාවස්ථාවේ ප්‍රතිපාදන අනුව, එම දැන්වීම් පුවරු මගින් ප්‍රදර්ශන බද්දක් අයකරනු ලබයි. ඊට	**2025 - රු. 172,886,135.85**	

				අමතරව කොළඹ මහා නගර සභාව සතු මාර්ගවල පදික වේදිකාවන් තුළ ඉඩ ඇති ස්ථානවල ප්‍රචාරක දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා පමණක් පෞද්ගලික ප්‍රචාරණ දැන්වීම් ආයතන වෙත ටෙන්ඩර් ක්‍රියාවලියන් මගින් එම ආයතන වෙත ප්‍රදානය කර ඇත. 2025 වසරේදී දැන්වීම් පුවරුවලින් ලැබී ඇති ආදායම රු. 172,886,135.85 කි. ඒ අනුව 2026 වසරේදී රුපියල් මිලියන 240ක ඉලක්කයක් ළඟා කර ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.		

04	කොළඹ නගර සභා බල ප්‍රදේශයේ වාහන නැවැත්වීම (Vehicle Parking)	කොළඹ නගරයේ දිනකට වාහන 5000 ක් පමණ නවතා තැබීමට මාර්ගය දෙපස සළකුණු කර ඇති බවත්, ඒවායින් ආදායම් ලබන මාර්ග පුවත්පත් මඟින් ටෙන්ඩර් කැඳවා ලබා දී ඇති බවත් ග.නි. ප්‍රකාශ කළේ ය. **<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>** කොළඹ නගරයේ අක්‍රමවත් රථවාහන නගර කිරීම තුළින් කඩ හිමියන්ට සිදු වන අවහිරය මහහැරවීමට කටයුතු කිරීමේ අවශ්‍යතාවය සහ අතරමැදි පිරිසක් අයුතු ලාභ ලැබීම් පිළිබඳව අවධානය යොමු කළ කාරක සභාව විධිමත් ලෙස වාහන නතර කිරීමේ පහසුකම් ඇති කර ඉන් නගර සභාවට සැලකිය යුතු ආදායමක් ලබා ගැනීමේ අවශ්‍යතාවය මෙන්ම රථවාහන හිමියන්ගෙන් අයුතු ලෙස මුදල් අයකිරීම නතර කිරීමේ අවශ්‍යතාවයද අවධාරණය කළේය. කොළඹ නගරය තුළ විධිමත් ලෙස වාහන නැවැත්වීමට සලසා ඇති පහසුකම් හා ලබන ආදායම් පිළිබඳ වාර්තාවක් 2024 අප්‍රේල් 22 දිනට පෙර කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළේය. කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/AQ/CPA/2024(I) හා 2024.07.12 දිනැති ලිපියෙන් කොළඹ නගරයේ එක් එක් රථගාල්	කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ අංක MT/ADM/AQ/COPA/2024(1) හා 2024.07.12 වාර්තාවේ සඳහන් පරිදි කොළඹ මහා නගර සභාව ශ්‍රී ලංකා පොලිසියේද සහයෝගය ඇතුව රථගාල් ස්ථානයන්හි ක්‍රමවත් පරිදි වාහන ගාල් කිරීමත් , අයුතු ලෙස මුදල් අය කිරීම වැළැක්වීමටත් කටයුතු කරමින් පවතී. එසේම, මේ වන විට ක්‍රියාත්මක කරන කොළඹ නගරයේ රථගාල් කළමනාකරණය හා මුදල් අය කිරීම අදියර XXVI කොන්ත්‍රාත්තුවේ පහත කොන්දේසි පනවා ඇත. 01. කොළඹ මහ නගර සභාව විසින් නිසි ලෙස අනුමත නොකළ ස්ථානවල වාහන නැවතුම් ගාස්තු අයකිරීම, නියමිත ගාස්තුවට වඩා වැඩි මුදලක් අයකිරීම කොන්ත්‍රාත්කරුට හෝ ඔහුගේ සේවකයන්ට අවසර නොමැති බව 02. වාහන නැවතුම් ස්ථානවල වාහන නවතා තැබීම, නියමිත ලකුණු කිරීම් (lot markings) අනුව, පදිකයන්ට හෝ මාර්ග ගමනාගමනයට බාධාවක් නොවන අයුරින් කළමනාකරණය කළ යුතුය. සම්මත රථගාල් ස්ථානයක පහත පරිදි රථවාහන නවතා තැබිය හැකි අතර මෙම සීමාව ඉක්මවා කටයුතු කිරීමට කොන්ත්‍රාත්කරුට හෝ ඔහුගේ සේවකයන්ට අවසර නොමැති බව • මෝටර් රථ / වෑන් / ජීප් – උපරිම 1 ක් • ත්‍රිරෝද රථ – උපරිම 2 ක් • යතුරුපැදි – උපරිම 4 ක් ඒ අනුව අදියර XXVI කොන්ත්‍රාත්තුවේ ඉහත කොන්දේසි තුන් වතාවකට වඩා උල්ලංඝනය කර ඇති බවට ඡායාරූප, හඬ පට, වීඩියෝ පටිගත කිරීම්, මහජන පැමිණිලි හෝ කොළඹ මහා නගර සභාවේ නිරීක්ෂණ මඟින් තහවුරු වුවහොත්, නාගරික කොමසාරිස්වරයාට කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ බලය ලබා දී ඇත. එවැනි අවස්ථාවලදී, කාර්ය සාධන ඇප මුදල (Performance Security) සම්පූර්ණයෙන් ම සභාව වෙත අය කරගනු ලබන අතර එම කොන්ත්‍රාත්කරු අනාගත කොන්ත්‍රාත් ප්‍රදානයන් සඳහා සලකා නොබලයි.

		ස්ථාන වලින් ලැබෙන මාසික ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව ලැබෙන මාසික ආදායම රු.22,003,730.00 වන බව වාර්තා කර ඇත.	
05	කොළඹ නගරයේ වතු ආශ්‍රිතව ජීවත්වන ජනතාව විසින් අවිධිමත් ලෙස බැහැර කරනු ලබන අපද්‍රව්‍ය/ කසළ පිළිබඳව හා ඒ හරහා සිදුවන පාරිසරික හානිය. * අවිධිමත් ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාළව දඩ පැනවීමේ ක්‍රමවේදයක්	Waste to Energy ව්‍යාපෘතිය යටතේ කසළ ටොන් විශාල ප්‍රමාණයක් එකතු වී තිබුණ ද එම ව්‍යාපෘතිය විධිමත්ව ක්‍රියාත්මක නොවීම තුල අනාගතයේදී අර්බුදකාරී තත්වයක් ඇතිවිය හැකි බව අවධාරනය කළ කාරක සභාව ඊට මැදිහත් වී ව්‍යාපෘතිය විධිමත්ව ක්‍රියාත්මක කිරීමට සුදුසු පියවර ගන්නා ලෙස ප්‍ර.ග.නි වෙත උපදෙස් ලබා දුන්නේය.	• Waste to Energy ව්‍යාපෘතිය කෙරවළපිටිය කසළ අංගනය හරහා දෛනිකව එකතු වන කසළ මෙට්ට්‍රික් ටොන් 450 ක් පමණ දහනය කර මෙගා වොට් 10 ක විදුලි උත්පාදනයක් ජාතික විදුලි පද්ධතියට ලබා දීම සිදු කරයි. • අදාල පද්ධතිය තාවකාලික ඇණහැටීම් හා අළුත්වැඩියා කටයුතු වලදී එකතු වන කසළ ශ්‍රී ලංකා ඉඩම් සංස්ථාව (SLLDC) වෙත භාර දී කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු සිදු කරයි. තවද එවැනි අවස්ථාවලදී නොදිරන කසළ මාදම්පිටිය කසළ අංගනයේ තාවකාලිකව රැස්කර තබා ගන්නා අතර / අළුත්වැඩියා කටයුතු අවසන් වූ පසු ඒවා නැවත දහනය කොට විදුලි නිෂ්පාදනය සඳහා යොදා ගනී. • එනමුදු කෙරවළපිටිය විදුලි ජනන පද්ධතිය නඩත්තු කටයුතු සඳහා සතියක පමණ කාලයක් තාවකාලීකව අත්හිටුවන අවස්ථාවලදී කසළ කළමනාකරණය කර ගැනීම දැඩි අපහසුතාවයට පත් වේ. එබැවින් කොළඹ මහා නගර සභාව විසින් වර්තමානයට පමණක් සීමා නොවී අනාගතයට වඩාත් ගැලපෙන කසළ කළමනාකරණයේ තිරසර විසඳුම් සොයමින් සිටින පසුබිමක දකුණු කොරියාවේ සෝල් මෙට්‍රොපොලිටන් රජය විසින් පවත්වනු ලැබූ Seoul ODA Challenge -2024 වැඩසටහන සඳහා රටවල් 35ක යෝජනා 95ක් අතරින් කොළඹ මහා නගර සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අංශය විසින් ඉදිරිපත් කරන ලද ජෛවභායනයට ලක්විය හැකි කසළ (biodegradable waste) භාවිතයෙන් ඇතිවන මීතේන් වායුව මඟින් විදුලිය නිපදවීමේ (Methane Capturing) යෝජනාව මුල් ස්ථාන 03 අතරට පත්විය. මේ සම්බන්ධයෙන් දකුණු කොරියානු විශේෂඥ කණ්ඩායම විසින් පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ඊට අදාල වාර්තාව සණ අපද්‍රව්‍ය අංශය වෙත ලබාදී ඇත. එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ඉඩමක් මේ වන තෙක් ලැබී නොමැති තත්වයක් තුල ඉඩමක් ලබා ගැනීමට ශ්‍රී ලංකා ඉඩම් සංස්ථාව සමඟ සාකච්ඡා කරමින් පවතින

	පවතීද යන්නත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වැඩපිළිවෙල කවරේද යන්නත් පිළිබඳව කාරක සභාව විමසීය. * රජය විසින් රු. බිලියන 106ක වියදමක් දරා ඉදිකළ 2019 අප්‍රේල් මස ක්‍රියාත්මක වූ අරුවක්කාරු		බවත් ඒ සඳහා සුදුසු ඉඩමක් මෙතකේ නොලැබීම මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි පසුබිමක් නිර්මාණය වී ඇත. මෙමඟින් දෛනිකව දිරන කසල මෙට්‍රික් ටොන් 250ක් පමණ කළමනාකරණය කිරීමට බලාපොරොත්තු වන අතර, ජනනය වන විදුලිය ජාතික විදුලි බල පද්ධතිය වෙත ලබාදීමට අපේක්ෂා කෙරේ. කොළඹ කැලි කසල අර්බුදය සඳහා තිරසාර විසඳුමක් මේ මඟින් නිර්මාණය කර ගත හැකි බව අපේක්ෂා කරමි.

	කසළ අංගනය කාර්යක්ෂමව භාවිතා නොකිරීම පිළිබඳව මෙන්ම Waste to Energy ව්‍යාපෘතිය පිළිබඳව ද කාරක සභාවේ දී සාකච්ඡාවට ලක් විය.	කොළඹ නගර සභා බල ප්‍රදේශයේ කසල / කුණු ඇති ස්ථාන නිවැරදිව හඳුනාගැනීම WhatsAap හා මුහුණුපොත (Facebook) හරහා දැන්වීම් පල කිරීම මඟින් අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලෙසත්,	• පැය 24 පුරා ක්‍රියාත්මක අංක අංක දරණ 0707222220 WhatsAap දුරකථනය හරහා සියළුම දැන්වීම් ප්‍රචාරයන් සහ වීඩියෝ ඇතුලත් කර තොරතුරු බෙදා හැරීම සහ ලබාගැනීම ක්‍රියාවන් සිදු කරන අතර සහ පැමිණිලි සටහන් වාර්තා කිරීමේ කටයුතු ද එමඟින්ම සිදු කරයි. • කොළඹ මහා නගර සභාව නිල වෙබ් අඩවිය වන w.w.w.colombo.mc.gov.lk හරහා සහ අපද්‍රව්‍ය කළමනාකරණ අංශයේ ප්‍රධාන කාර්යාලයේ සහ දිසා කාර්යාල 06 ට අදාල දුරකථන අංක හා විද්‍යුත් තැපෑල සඳහන් කර ඇත. • Colombo Municipal Council යන මුහුණුපිටුව හරහා මහජනතාවට වීඩියෝ පට හා දැන්වීම් පත්‍රිකා මඟින් මනා සන්නිවේදනයක් පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. • ජංගම CCTV නිරීක්ෂණ කටයුතු හරහා අනවසර කසල බැහැර කිරීම් වැටලීමටත් ඒ සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කිරීමටත් මේ වන විට ආරම්භ කර ඇත. තවද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා අනවසර කසල බැහැර කිරීම් කරන ස්ථාන හා පුද්ගලයන් හඳුනාගෙන ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නඩු කටයුතු සිදුකර දඩුවම් ලබා දීම සිදු කරයි. • ඉහත සඳහන් සියලුම ආකාරයෙන් ලබා ගන්නා පැමිණිලි විධිමත්ව විභාග කර, වශයෙන් ඉදිරි කටයුතු සිදු කිරීමට පරිසර පොලිසිය සමඟ සමීප සම්බන්ධතා පවත්වා ගනිමින් නීතිමය ක්‍රියාමාර්ග සිදු කිරීමට අවශ්‍ය සියලු කටයුතු සහ අපද්‍රව්‍ය අංශය විසින් සිදු කරයි. • කොළඹ නගර සභා බල ප්‍රදේශය තුල රැස්වන කැලි කසල නගර සභා විසින් හා කොන්ත්‍රාත් පදනම මත ලබාදුන් ආයතන සඳහා විධිමත්ව කළමනාකරණය කර දෛනිකව එකතු කිරීම් සිදු කරන අතර දැනුවත් කිරීමේ ප්‍රචාරන කටයුතු (Announcement), පාසල් දැනුවත් කිරීමේ වැඩසටහන්, පොලිසි ස්ථාන දැනුවත් කිරීමේ වැඩසටහන්, ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අත්පත්‍රිකා බෙදාදීම වැනි කටයුතු වල නිරත වෙමන් නිරන්තරයෙන් කසල කළමනාකරණය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සිදු කරයි. • එමෙන්ම විදුලි කණුවල සහ දුරකථන කණුවල සවිකරන දැන්වීම් සහ අනවසර දැන්වීම් පුවරු ඉවත් කිරීමේ කටයුතු සහ අපද්‍රව්‍ය අංශය විසින් සිදු කරනු ලබයි.
		කොළඹ නගර සභා කසල පැහැර කිරීම පිළිබඳ වැඩි අවධානයක් හා අධීක්ෂණයක් යොමු කර කටයුතු කරන ලෙසත්,	
		කොළඹ නගර සභා කසල කළමනාකරණය, වාහන නැවැත්වීම හා දැන්වීම් පුවරු සම්බන්ධ ගැටළු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර කටයුතු කරන ලෙසත්, කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළේය.	

06	මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් Winching Machine යන්ත්‍රය ප්‍රායෝගිකව භාවිතා කළ නොහැකි බව හා එය නිශ්ක්‍රීයව පැවතීම	කුඩා යන්ත්‍රයකින් සිදුකල නොහැකි නල තුළ සිදුවන අවහිරවීමක් (Blockages) යථා තත්ත්වයට පත් කර ගැනීම අවශ්‍යවන අවස්ථාවලදී මෙම යන්ත්‍රය භාවිතා කරන බව කොළඹ මහා නගර සභාවේ ග.නි. ප්‍රකාශ කළේය. නිරීක්ෂණ/ නිර්දේශ එම යන්ත්‍රය ඵලදායී ලෙස යොදා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරක සභාව ග.නි. වෙත නිර්දේශ කළේය.	මෙම යන්ත්‍රය විශාල ප්‍රමාණයේ අවහිරතා ඉවත් කිරීම සඳහා යොදා ගනි. මලලසේකර මාවත, බෞද්ධාලෝක මාවත, සිරිල් සී. පෙරේරා මාවත (බිලුමැන්ඩල් පාර) යන ප්‍රදේශවල භූගත වැසි ජල පද්ධති අවහිරතා ඉවත් කර, වැලි ඉවත් කර, පිරිසිදු කිරීම් යොදා ගැනීම උදාහරණ වේ. එක් යන්ත්‍රයක් අළුත් වැඩියාවේ ඇති අතර අනෙක් යන්ත්‍රය ජලාප්‍රවාහන -වින්චින් අංශයේ ක්‍රියාකාරීව පවතී. ඉදිරියේ දී මෙම යන්ත්‍ර දෙක කොළඹ නගරයේ ඇති වැසිජල පද්ධතින් වලට වැලි හා අපද්‍රව්‍ය එකතු වීම නිසා ඇති වන අවහිරතා ඉවත් කිරීම සඳහා යෙදවීමට බලාපොරොත්තු වේ.
07	මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2වන අදියර Greater Colombo Water & Wastewater	උක්ත ව්‍යාපෘතියේ 2 කොටසෙහි (Tranche 2) වටිනාකම ඇ.ඩො.මි. 9ක් බවත්, ඒ යටතේ ව්‍යාපෘතියේ 3 කොටසෙහි (Tranche 3) සිවිල් කටයුතු (civil works) සඳහා අවශ්‍ය විශේෂඥයන් (Consultants) තෝරා ගැනීම සහ ව්‍යාපෘතියේ ඉතුරු මළ නාලිකා සඳහා CCTV සමීක්ෂණය සිදුකරන	අපජල පවිත්‍රාගාරයේ වැඩ කටයුතු සඳහා බාහිර අරමුදල්/ මධ්‍යම රජයේ අරමුදල් ලබාගැනීමේ හැකියාව පිළිබඳව නිරන්තර උත්සාහයක් පවතී. කෙසේ වුවද කොළඹ නගරයේ අපජල පද්ධතියේ පැරණි භාවය නිසා එම පද්ධතිය නිරන්තරයෙන් බිඳවැටීමක්, පවතින පද්ධතියේ ධාරිතාව වර්තමාන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවීමත් මත නිරන්තරයෙන් පද්ධතියේ බිඳවැටීම් සිදුවීම මත මෙම අභ්‍යන්තර ජල අපවහන පද්ධතියේ ප්‍රතිසංස්කරණ සඳහා දැනට පවතින සීමිත සම්පත් හා අරමුදල් භාවිත කිරීම සිදුවේ. අභ්‍යන්තර පද්ධතියේ ගැටළු විසඳනු ලැබීමෙන් පසු අවසන් බැහැර කිරීම සඳහා ප්‍රමුඛත්වයක් ලබාදීමට ක්‍රියාකරනු ඇත.

	Management Improvement Investment Project- GCWWMIIP (Tranche 2 & 3)	බවත්,	
		Tranche 3 යටතේ කිරුළපන නල ජලාපවහන කොන්ත්‍රාත්තුව (Kirulapone Pipe Borne Sewer Contract)සහ වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය (Wellawatta Waste Water Treatment Plant) ඇතුළත් වූ බවත්,	
		වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය අවසන් කර ඇති බවත් (Terminated) එහි network කටයුතු සිදුවෙමින් පවතින බවත්, වැල්ලවත්ත අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම	

		කිරුළපන කොන්ත්‍රාත්තුව (Kirulapana Contract) 2025.12.31 දිනට අවසන් වීමට නියමිත බව හා එහි ඉදිකිරීම් කටයුතු Larsen & Turbo (L & T) නම් කොන්ත්‍රාත්කරු වෙත භාර දී ඇති බවත්, එම කොන්ත්‍රාත්තුවේ සැලසුමෙහි (design) පැවති ගැටලු විසඳීමට විශේෂ කමිටුවක් පත්කළ බව හා කොළඹ නගර සභාවේ තාක්ෂණික දැනුම සහිත විශේෂඥයින් කණ්ඩායමක් යොදවා කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් යෝජනාවක් (proposal) ලබා දෙන ලෙසට කමිටු තීරණයක් ලබා දුන් බවත්, එම විශේෂඥයින් කණ්ඩායමේ යෝජනාවලිය පිළිබඳව කොන්ත්‍රාත්කරු සමඟ ද සාකච්ඡා කර මාස 02ක් තුළ අවශ්‍ය සංශෝධන සිදුකර මෙම කොන්ත්‍රාත්තුවේ කටයුතු අවසන්	අමප/20/1600/816/071 අංක දරණ 2025-09-16 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය කිරුළපන කොන්ත්‍රාක්තුව සඳහා කොන්ත්‍රාත් සංශෝධනය 2025-10-23 අත්සන් කරන ලද අතර දැනට කොන්ත්‍රාත්කරු තලකොටුව කාලිංග මාවත සහ S8 පොම්පාගාරවල වැඩ නැවත ආරම්භ කර වැඩ කටයුතු කරමින් පවතී. එසේම ගුරුත්ව යටතේ වූ නල එලීමද ආරම්භ කර ඇත. මෙම කාර්යය 2027-12-31 අවසන් කළ යුතුය. සැලසුමෙහි (design) පැවති ගැටලු විසඳා ප්‍රගතියේ පවතී.

		කිරීමට නියමිත බවත්,	
08	Greater Colombo Water & Wastewater Management Improvement Investment Project-GCWWMIIP (Tranche 3) යටතට ගැනෙන යුරෝපානු ආයෝජන බැංකුව (European Investment bank) ප්‍රදානය	මහා කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ කටයුතු කොළඹ මහ නගර සභාවේ අභ්‍යන්තර විගණකවරයාගේ අධීක්ෂණයට ලක් කරන ලෙස කාරක සභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත නිර්දේශ කළ අතර, මීට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති නගර සභා කාර් යය මණ්ඩලයේ ගෙවීම් කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙසද කාරකසභාව විසින් ප්‍ර.ග.නි./ග.නි. වෙත උපදෙස් දුන්නේය.	2024-03-26 වැඩ ආරම්භ කළ කිරුළ- නාරාහේන්පිට ව්‍යාපෘතිය (Power Chaina Zhongnan Engineering Coorperation) වෙත ප්‍රධානය කර දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. කිරුළ පොම්පාගාරය සහ නළ එළිමෙ කටයුතු අධීක්ෂණය MSD අනුමත අර්ධකාලීන සහ පූර්ණකාලීන (PMU) කාර්යය මණ්ඩලය විසින් සිදුකරගෙන යමින් පවතී. 2027-12-08 වන විට ව්‍යාපෘති කටයුතු නිම කිරීමට බලාපොරොත්තු වේ, මහ කොළඹ අපජල කළමණාකරන ව්‍යාපෘතියේ (පෙර ADB අරමුදල්) අර්ධකාලීන හා පූර්ණකාලීන කාර්යය මණ්ඩලය සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත. Southern ව්‍යාපෘතිය - ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර, කරගෙන යමින් පවතී.

	කළ යුරෝපීය ණය ආධාර මුදල යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිය		

ඒ. ඩී. එස්. රෝහණ (රා.ඉ.)
නාගරික කොමසාරිස්
කොළඹ මහා නගර සභාව

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ඉ.)
කොළඹ මහා නගර සභාව

දුරකථන අංකය : 0112699316
ෆැක්ස් අංකය : 0112699316
විද්‍යුත් ලිපිනය : ma175@colombo.mc.gov.lk

පිටපත :

පාර්ලිමේන්තු මහ ලේකම් - කා.දැ.ගැ.පි
ලේකම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව - කා.දැ.ගැ.පි
පාර්ලිමේන්තුවේ සභා නායක ලේකම් - කා.දැ.ගැ.පි
ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත් සභාව - කා.දැ.ගැ.පි
පළාත් පාලන කොමසාරිස්, බස්නාහිර පළාත. - කා.දැ.ගැ.පි

AGREEMENT

No. 3737

THIS AGREEMENT is made and entered into at Colombo on this 11th day of September, Two Thousand and Ten (2010) at Colombo in the Democratic Socialist Republic of Sri Lanka between Omar Zuraik Kamil the **SPECIAL COMMISSIONER**, Municipality of Colombo, duly appointed as such by order published in Government Gazette Extra – Ordinary No. 1659/13 Dated 22nd June 2010 (hereinafter called **"THE SPECIAL COMMISSIONER"** which term shall mean and include said Omar Zuraik Kamil his successors or successors in office of the Municipal Council of Colombo when reconstituted) and Jayawardena Mudiyanselage Bhadrani Jayawardena the **MUNICIPAL COMMISSIONER** of Colombo (which term shall mean and include said Jayawardena Mudiyanselage Bhadrani Jayawardena her successor or successors in office of the Municipal Commissioner) as the **PARTY OF THE FIRST PART.**

AND

Richardson Outdoor (Private) Ltd. a company duly incorporated under the Companies Act of Sri Lanka having it's registered office at No.342, level 03, Galle Road, Colombo 03. (hereinafter called and referred to as **"THE COMPANY"** which term or expression shall whereever the context so requires or admits mean and include the said **Richardson Outdoor (Private) Ltd** and its successor or successors in office and assigns) as the **PARTY OF THE SECOND PART.**

WITNESSETH

Whereas the Council has called for tenders for the maintenance of 38 numbers existing gantries and the erection and maintenance of 10 new gantries in the City with a bonus project to erect and maintain 1525 street name boards in the City by newspaper advertisement published in April 2010.

TRUE COPY

And Whereas the said Company has made its offer dated 21st of May 2010 for the maintenance of Nos. 38 gantry signs and the erection of 10 new gantries in the City with a bonus project to erect and maintain 1525 street name boards in the City (hereinafter sometimes called and referred to as "The Works").

Eng. Y. A. P. Amarasena
Traffic Engineer (Design)
Traffic, Design & Road Safety Division
Colombo Municipal Council

55

Whereas the Special Commissioner of the said Council at a meeting held on 28th July 2010 has approved to accept the said offer made by the said Company by its Resolution No.1151 and the parties have now agreed upon the following terms and conditions;

Now this Agreement Witnesseth and it is hereby agreed by and between the parties hereto as follows:

1. This Agreement is for a period of **eight (08)** years in total with effect from 11th of August, 2010 till 10th of August, 2018, provided that the Company shall execute the following work within given time periods in accordance with tender documents together with proposal of the said Company (marked as "X1" and part and parcel of this agreement) to the satisfaction of Deputy Municipal Commissioner (Engineering Services) of the Council.

   (a) Continuous maintenance work of Thirty Eight (38) existing gantry signs (marked as "X2" and part and parcel of this agreement) in Colombo with proper directional signs to provide attractive appearance with safety.

   (b) Installation of new Ten (10) gantries with proper directional signs in Colombo within the 1st year of works and continuous maintenance work of such gantries with proper directional signs to provide attractive appearance with safety.

   (c) Erection of 400 street name boards within the 1st year of the works and continuous maintenance of such boards to provide attractive appearance with safety.

   (d) Erection of 400 street name boards (in addition to the 400 mentioned in Clause (c) above) within the 2nd year of the Works and continuous maintenance of such boards to provide attractive appearance with safety.

   (e) Erection of 725 street name boards (in addition to the 800 mentioned in Clause (c) and (d) above) within the 3rd year of The Works and continuous maintenance of such boards to provide attractive appearance with safety.

   (f) Make due payments to the Council on time.

TRUE COPY

2. The Council shall provide mutually agreed dates to complete and adequate information in respect of the location of each and every gantry and street name board and the correct names of the streets in all three languages in a timely manner within the 1st, 2nd and 3rd years of the works aforementioned.

09/22
Eng. Y. A. P. Amarasena
Traffic Engineer (Design)
Traffic, Design & Road Safety Division
Colombo Municipal Council

3. The Company shall pay the due payments of rentals to the Council on time as per table given below.

Payment Due Date	Amount in Rs. Inclusive of VAT	Period Covered
2011.02.11	7,257,600.00	2010.08.11-2011.08.10
2012.02.11	9,788,800.00	2011.08.11-2012.08.10
2013.02.11	10,304,000.00	2012.08.11-2013.08.10
2014.02.11	10,819,200.00	2013.08.11-2014.08.10
2015.02.11	11,334,400.00	2014.08.11-2015.08.10
2016.02.11	11,849,600.00	2015.08.11-2016.08.10
2017.02.11	12,364,800.00	2016.08.11-2017.08.10
2018.02.11	12,880,000.00	2017.08.11-2018.08.10

4. The Company shall furnish a Performance Security valid for **ninety eight months** (98) in the form of a Bank Guarantee obtained from a Bank in Sri Lanka acceptable to Colombo Municipal Council for a sum of **Rupees One Million Five Hundred Thousand** (Rs. 1,500,000.00) at the time of signing this agreement.

5. If the Company fails to perform its obligations as set out in Clause 1 above and/or fails to carry out installation and maintenance work to the satisfaction of the Deputy Municipal Commissioner (Engineering Services), the council shall convey to the company its dissatisfaction in writing requiring the company to rectify same within a period of thirty (30) days where the dissatisfaction in relation to the installation and maintenance by the company a report from a Chartered Structural Engineer as to the rectifications carried out shall be provided to the council. Should the company fails to take necessary steps to improve the standard of installation and maintenance , the performance bond submitted in that behalf will be forfeited and action will be taken to terminate the project. In such an event, this agreement shall become null and void on termination of the project.

TRUE COPY

6. The Company shall maintain two gantries at Hospital Square to the expected standard and safety and such two gantries are not allowed for advertising. Council shall direct the Company to display public awareness messages on these two gantries.

Eng. Y. A. P. Amarasena
Traffic Engineer (Design)
Traffic, Design & Road Safety Division
Colombo Municipal Council

7. Any proposal to erect new gantries and street name boards not covered by this agreement will be offered to the Company and in such situation the Company may erect and maintain such structures at their own cost.

(53)

8 The Company shall also maintain at its expense for the duration of this Agreement making due payments to the Council in accordance with the provisions of this Agreement in respect of existing gantries within the City not forming part of this Agreement at the request of the Deputy Municipal Commissioner (Engineering Service) from time to time.

